# කලාගම් විහාර අත්තාණි ලිපිය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

පී.පී.කේ. දිල්රංග[1]

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ හල්මිල්ලවැටිය ග්‍රාමයේ කලාගම් විහාරය පිහිටා ඇත. මේ විහාරය ක්‍රි.ව 9-10 වැනි සියවස් අතර කාලයේ රාජ අනුග්‍රහය ලබමින් සමෘද්ධිමත්ව පැවතුණු බවට පුරාවිද්‍යාත්මක සාධකවලින් පැහැදිලි වේ. මෙම විහාරස්ථානයේ පවතින පුරාවිද්‍යාත්මක අතින් වැදගත් මූලාශ්‍රයක් ලෙස අත්තාණි ලිපිය හැදින්විය හැකිය. මෙම ලිපිය 1961 වර්ෂයේ දී සිරිමල් රණවැල්ල විසින් වාර්තා කරන ලද අතර එයින් හෙළිවන සමකාලීන සමාජය, ඓතිහාසික තත්ත්වය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. මෙම පර්යේෂණය සඳහා අධ්‍යයන ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර ගවේෂණය හා මූලාශ්‍රය අධ්‍යයනය මගින් ලබාගත් දත්ත වාර්තාගත කිරීම හා විශ්ලේෂණය කිරීම සිදු කරන ලදී. ටැම්ලිපියේ සඳහන් වන භාෂාව හා අක්ෂර මධ්‍යකාලීන සිංහල වන අතර එය උසෙන් අඩි 7 ක් පමණ වූ ශිලා ටැඹක් වූ බව රණවැල්ල විසින් වාර්තා කර ඇත. වර්තමානයේ අත්තාණියේ උස අඩි 4, අගල් 5 කි. ලිපියෙහි සිව් පසෙහිම අක්ෂර ලියා ඇති අතර මෙහි අන්තර්ගතය නම් හතර වැනි කාශ්‍යප රජුගේ දහසය වැනි රාජ්‍ය වර්ෂයේ පොසොන් පුර පක්ෂයේ කරවන ලද අභයගිරි මගුල් පිරිවෙණට අයත් වැදාරා පිරිවෙණෙහි කලාගම් විහාරයේ සීමාවන් තුළට රාජ්‍ය නිළධාරින් හා ගැල් ගොනුන්, මී ගොනුන්, අලීන් ඇතුළු නොකළ යුතු බව හා එය උල්ලංඝණය කරන්නන්ට ශාප කිරිමක් කළ බව සඳහන් වේ. ඒ අනුව පැහැදිලි වන්නේ සමකාලීනව මෙම පිරිවෙණ හා විහාරය තුළට එතෙක් රාජකාරි නිළධාරින්, ගැල්, සතුන් පැමිණ වූ බවත් ඒ හරහා මෙහි භික්ෂූන්ට පීඩාකාරි තීත්වයක් ඇතිවුන හා දේපළවලට අලාබහානි සිදු වූ බවත්ය. මෙම අත්තාණිය පිහිටුවා ආඥා පැනවීමෙන් අපේක්ෂා කරන්නට ඇත්තේ එකී තත්ත්වය සීමාකිරීම විය හැකිය. තව ද එකල මේ ප්‍රදේශය හැදින්වූයේ ලොහොලුපල කුලිය යනුවෙන් බව ලිපියෙහි එම නාමය අන්තර්ගත වීමෙන් පැහැදිලි වේ. විහාරයට සෙනවිවරුන් පවා විටින් විට පැමිණීම හේතුවෙන් ප්‍රදේශයේ ප්‍රධාන ආගමික කේන්ද්‍රස්ථානයක් බවට මෙය පත්ව තිබෙන්නට ඇති බව උපකල්පනය කළ හැකිය. සමකාලීන ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථානය වූ අභයගිරි විහාරයේ අනු පිරිවෙණක් වීම තුළින් කලාගම් විහාරය තුළ භික්ෂූන් තරමක් විශාල පිරිසක් සිටින්නට ඇති අතර රජුගේ පටන් සාමාන්‍ය වැසියා දක්වා මෙහි ආගිය බවත් ටැම්ලිපිය අනුව අනාවරණය වේ. මෙසේ අත්තාණි ප්‍රකාශයක් සටහන් කිරිමෙන් එකල ජනයාගේ භාෂා සාක්ෂරතාවය පිළිබඳව ලිපිය හරහා දැනුවත් වූ බව හඳුනාගත හැකිය. ඒ අනුව කලාගම් විහාර අත්තාණි ලිපියෙන් දැක්වෙන කරුණු තුළින්, සමකාලීන සමාජය පිළිබඳව සහ කලාගම් විහාරයේ ඓතිහාසිකත්වය පිළිබඳව තොරතුරු රාශියක් හෙළිකර ගැනීමට හැකිය.

**ප්‍රමුඛ පද :** කලාගම් විහාරය, අත්තාණි ලිපි, ශාප පාඨ, අභිලේඛන

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.krishmaldilranga1@gmail.com